සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

10 ශ්‍රේණිය

නාට්‍ය හා රංගකලාව - I

කාලය පැය 03 යි
අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි :
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

- පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය කොටස් ඇසුරෙන් 1 සිට 5 දක්වා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A - මූදු පතුල යට ඉදලා
මුතු ඇටයක නිදි කරවා
පෙණ කැටියක පා කරවා
මගේ දෝතට පුතු ආවා

B - සෝබාව දේ මෙපුර සිරි විසිතුරු
බලනු මිතුරු මඟ පියකරු වූ
සුසුදු වළා කැරළි පලසකි මේ
මග දිග ඇතිරූ

C - හනික වරෙව් කොල්ලනේ
මෙන්න මෙහෙ වරෙව්
මෙන්න මෙහෙ වරෙව් කොල්ලනි
නට නටා වරෙව්

D - සුරතින් යව මුගුරක් ගෙන අල්ලා
වමතින් අතුකැටියක් ගෙන අල්ලා
පරොසින් රෑ සිහිනෙන් අල්ලා
කොර සන්නියෙ යකු එයි පුද ඉල්ලා

E - සුරතින් කඩුව ගෙන ගිනි කබල වම් අතින්
රතුවන් කඩක් ඇඳ නිල් තුරඟෙකු ද පිටින්
නරයින් බිය කරයි ලේ පොලඟෙකුද කටින්
මෙලෙසින් සූනියම් දෙවි මෙහි වඩිනු ඉතින්

01. සංඛපාල රජු හා සම්බන්ධ ශාන්තිකර්මයට අයත් පද්‍යයක් දැක්වෙන අක්ෂරය වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

02. ග්‍රීක සැටර් නාට්‍යක් ඇසුරෙන් නිර්මාණය කළ නාට්‍යයකට අදාළ අක්ෂරය වන්නේ,
(1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.

03. සූනියම් යාගය ශාන්තිකර්මයට අදාළ අක්ෂරය වන්නේ,
(1) E ය. (2) D ය. (3) C ය. (4) B ය.

04. ගුණසේන ගලප්පත්ති විසින් නිර්මාණය කළ නාට්‍යයකට අදාළ අක්ෂරය වන්නේ,
(1) C ය. (2) D ය. (3) E ය. (4) A ය.

05. තාරාවෝ ඉගිලෙති නාට්‍යයට අදාළ අක්ෂරය වන්නේ,
(1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.

Past Papers Wiki

- **ප්‍රශ්න අංක 06 සිට 15 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන නිවැරදි පිළිතුර තෝරන්න.**

06. නාට්‍යයක ඉදිරි ගමන තීරණය වන්නේ,
(1) ප්‍රේක්ෂක ප්‍රතිචාර මත වේ.
(2) නාට්‍ය පෙළ සාහිත්‍ය මත වේ.
(3) නාට්‍යෝචිත අවස්ථා මත වේ.
(4) අධ්‍යක්ෂකවරයාගේ කැපවීම මත වේ.

07. මෙහි නෘත්තවලට අදාළ වන්නේ,
(1) ඔපෙරා, ගීත නාට්‍ය ය.
(2) මුද්‍රා නාට්‍ය, බැලේ නාට්‍ය ය.
(3) රාධා ක්‍රිෂ්ණා, ශිව පාර්වති නර්තන ය.
(4) ලී කෙළි, වෙස් නැටුම් ය.

08. ''සියලු සිසුන්ගේ දකුණු පාදය දණහිසින් නවා වම්පාදයෙහි ස්පර්ශවන සේ තබා විශාල හුස්මක් ගන්නා ගමන් ම දෑත් හිසට ඉහළින් සිටින සේ ඔසවන්න.....'' මෙම ගුරු විධානයට අනුව සිදුකළ රංග අභ්‍යාසය වන්නේ,
(1) මනස සම්බන්ධ අභ්‍යාසය යි.
(2) සංවේදන අභ්‍යාසය යි.
(3) කටහඬ අභ්‍යාසය යි.
(4) පරිකල්පන අභ්‍යාසය යි.

09. ක්ෂණික නිරූපණයකින් ලැබෙන ප්‍රයෝජනයක් වන්නේ,
(1) සිරුරේ නම්‍යශීලීත්වය ඇති කර ගැනීමයි.
(2) තනිව කටයුතු කිරීමේ කුසලතාවය ලැබීමයි.
(3) අභිනය මැනවින් භාවිතයට හුරු වීමයි.
(4) දෙබස් තාලානුකූලව උච්ඡාරණයට හුරු වීමයි.

10. නාට්‍යමය අවස්ථාවකට උදාහරණයක් වන්නේ,
(1) මනමේ කුමරාට කුමරිය පාවා දීම.
(2) මනමේ රජු හා කුමරිය කැලේ ගමන් කිරීම.
(3) මනමේ කුමරියට වැදි රජු පෙම් කිරීම.
(4) මනමේ රජු හා වැදි රජු අතර සටන.

11. ''නාට්‍යය යනු ජීවිතයේ පෙත්තකි.'' යනුවෙන් ප්‍රකාශ කරන ලද්දේ,
(1) ඇරිස්ටෝටල් ය.
(2) බර්නාඩ් ෂෝ ය.
(3) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ය.
(4) භරතමුණි ය.

12. දික්තල කාලගෝල නාට්‍යයේ නාඩගම් සම්ප්‍රදායට අයත් ලක්ෂණයක් වන්නේ,
(1) සුවිශේෂ වූ අංගරචනා ක්‍රමයකින් යුක්ත වීම යි.
(2) ජීවිතාවබෝධයක් ලබා දීමට උත්සහ කිරීම යි.
(3) කාන්තා චරිත රංගනයෙන් දායක වීම යි.
(4) පොතේ ගුරු පූර්ණ වීදුරුව ගායනා කිරීම යි.

13. සමාරෝපය යන්නට වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) මුහුණේ අංගෝපාංගයන් මගින් අදහස් ප්‍රකාශ කිරීමයි.
(2) මදකට තම ස්වරූපය අමතක කර දමා වෙන කෙනෙකු සේ පෙනී සිටීමයි.
(3) පරිකල්පනයෙන් මවාගන්නා චරිත තාත්වික ලෙස නිරූපණය කිරීමයි.
(4) චරිතයට අදාළ වචන නාට්‍ය රඟ දැක්වෙන කාලය තුළ මැනැවින් හැසිරවීමයි.

14. නාට්‍ය අධ්‍යක්ෂකවරයා තම සියලුම වගකීම් භාර දෙන පුද්ගලයා වන්නේ,
(1) රූපණ ශිල්පියා ය.
(2) අංගරචන ශිල්පියා ය.
(3) වේදිකා පරිපාලක ය.
(4) පිටපත් රචකයා ය.

15. අංගරචනා උපකරණ වන්නේ,
(1) අයිබ්‍රෝ පෙන්සිල්, කණ්ණාඩිය ය.
(2) පනාව, රිමුවින් ක්‍රීම් ය.
(3) බ්‍රෂ්, පින්සල්, ස්පොන්ච් ය.
(4) නෝස්පොටි, ස්ප්‍රිට් ගම් ය.

- පහත ඡායාරූප ඇසුරෙන් 16 - 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ක	ග	ජ	ට	ඩ
				

16. මෙහි රංගනයෙන්, අධ්‍යක්ෂණයෙන් කැපී පෙනුණු නිර්මාණ ශිල්පියා / ශිල්පිනිය දැක්වෙන අක්ෂරය වන්නේ,
(1) ''ක'' ය. (2) ''ග'' ය. (3) ''ජ'' ය. (4) ''ඩ'' ය.

17. මෙහි 'සෝෂක වස්තුව'' නාට්‍ය නිර්මාණ ශිල්පියා / ශිල්පිනිය දැක්වෙන අක්ෂරය වන්නේ,
(1) ''ඩ'' ය. (2) ''ට'' ය. (3) ''ක'' ය. (4) ''ග'' ය.

18. යෙර්මා නාට්‍ය අනුවර්තනය කළ නාට්‍ය නිර්මාණ ශිල්පියා / ශිල්පිනිය දැක්වෙන අක්ෂරය වන්නේ,
(1) ''ග'' ය. (2) ''ජ'' ය. (3) ''ට'' ය. (4) ''ක'' ය.

19. නාට්‍ය කලාවේ සන්ධිස්ථාන යුගය සනිටුහන් කළ නාට්‍ය නිර්මාණ ශිල්පියා / ශිල්පිනිය දැක්වෙන අක්ෂරය වන්නේ,
(1) ''ජ'' ය. (2) ''ට'' ය. (3) ''ඩ'' ය. (4) ''ක'' ය.

20. ''මෝදර මෝල'' නාට්‍ය නිර්මාණ ශිල්පියා / ශිල්පිනිය දැක්වෙන අක්ෂරය වන්නේ,
(1) ''ග'' ය. (2) ''ජ'' ය. (3) ''ඩ'' ය. (4) ''ට'' ය.

- පහත වගුව ඇසුරෙන් 21 - 25 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ක	ග	ජ	ට	ඩ
මදුර ජවනිකා	ගැලීලියෝ	මනාලයෝ	පුස්ලෝඩං	බෝඩිංකාරයෝ
ඉබිකට්ට	වරෙන්තුව	ජනේලය	සුබ සහ යස	තට්ටුගෙවල්
බක් මහ අකුණු	උත්තමාවී	පව්කාරයෝ	පණ්ඩුකාභය	මුතුකුමාරි

21. හෙන්රි ජයසේන නාට්‍යකරුවාගේ නාට්‍යවලට අදාළ වන්නේ,
(1) ''ග'' ය. (2) ''ක'' ය. (3) ''ජ'' ය. (4) ''ඩ'' ය.

22. සුගතපාල ද සිල්වා නාට්‍යකරුවාගේ නාට්‍යවලට අදාළ වන්නේ,
(1) ''ක'' ය. (2) ''ට'' ය. (3) ''ජ'' ය. (4) ''ඩ'' ය.

23. පරාක්‍රම නිරිඇල්ල නාට්‍යකරුවාගේ නාට්‍යවලට අදාළ වන්නේ,
(1) ''ග'' ය. (2) ''ජ'' ය. (3) ''ඩ'' ය. (4) ''ට'' ය.

24. දයානන්ද ගුණවර්ධන නාට්‍යකරුවාගේ නාට්‍යවලට අදාළ වන්නේ,
(1) ''ජ'' ය. (2) ''ක'' ය. (3) ''ග'' ය. (4) ''ඩ'' ය.

25. සයිමන් නවගත්තේගම නාට්‍යකරුවාගේ නාට්‍යවලට අදාළ වන්නේ,
(1) ''ඩ'' ය. (2) ''ග'' ය. (3) ''ක'' ය. (4) ''ට'' ය.

- නිවැරදි පිළිතුර තෝරන්න.

26. තාලානුකූල චලනයක් සඳහා ඔබ සිදුකළ ක්‍රියාකාරකමක් හා සම්බන්ධ වන්නේ,
(1) සාමාන්‍ය ගමන් විලාසයෙන් ඇවිදීම යි. (2) රොබෝ මිනිසෙක් ලෙස ඇවිදීම යි.
(3) පාලමක් උඩ ඇවිදීම යි. (4) විවිධ පුද්ගල චරිත අනුකරණය කිරීම යි.

27. රූපණය හා සම්බන්ධ නිවැරදි තොරතුරක් වන්නේ,
(1) චරිතයකට ආරෝපණය වීම යි. (2) තමාගේ ස්වරූපය අමතක කර දැමීම යි.
(3) තවත් කෙනෙක් ලෙස පෙනී සිටීම යි. (4) අනුරූපණය මාධ්‍ය කර ගැනීම යි.

- ප්‍රශ්න අංක 28 - 31 තෙක් ප්‍රශ්නවලට <u>නොගැලපෙන</u> පිළිතුර තෝරන්න.

28. වේදිකා නාට්‍යයක සුවිශේෂතා හා සම්බන්ධ වන්නේ,
(1) සජීවී බව දක්නට ලැබීම යි. (2) සතර අභිනය භාවිත කිරීම යි.
(3) ඒක පුද්ගල නිර්මාණයක් වීම යි. (4) පෙළ සාහිත්‍යයක් තිබීම යි.

29. නෘත්‍ය හා සම්බන්ධ ප්‍රකාශයක් වන්නේ මින් කුමක් ද?
(1) ශුද්ධ නැටුම නමින් හැඳින්වේ. (2) භරත, කථක් හා කථකලි නැටුම් අයත් වේ.
(3) ආංගිකාභිනය හා සාත්විකාභිනය භාවිත වේ. (4) අර්ථාන්විත තාලානුකූල නැටුමකි.

30. රංගෝපකරණවලට අයත් වන්නේ,
(1) කඩුව යි. (2) හෙල්ල යි. (3) පොරොව යි. (4) මිරිවැඩි සඟල යි.

31. කතන්දරයක් හා සම්බන්ධ ප්‍රකාශය වන්නේ,
(1) අසමින් හෝ බලා රසවිඳීමට ඇත. (2) කෙටිකාලීන සිදුවීම් ඇත.
(3) නාට්‍යෝචිත අවස්ථා බහුලව ඇත. (4) මුල, මැද, අග, අනුපිළිවෙළින් ඇත.

- **පහත රූප ඇසුරෙන් අංක 32 - 34 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A 

B 

32. ඉහත A රූපයෙන් දැක්වෙන්නේ,
(1) කණ සන්නිය යි. (2) පිස්සු සන්නිය යි. (3) ගිනිජල සන්නිය යි. (4) දෙමළ සන්නිය යි.

33. ඉහත B රූපයෙන් දැක්වෙන්නේ,
(1) භූත සන්නිය යි. (2) සෙලෙස්ම සන්නිය යි.
(3) පිත් සන්නිය යි. (4) දේව සන්නිය යි.

34. මෙම මුහුණුවලට අදාළ ශාන්තිකර්මයට අයත් තොරතුරු දැක්වෙන වරණය වන්නේ,
(1) මැණික්පාල, වසවර්තියා, විෂ පොළඟා ය. (2) විෂ්ණු, ඊශ්වරයා, සළුව ය.
(3) දාසිය, මහඇමති, මී අඹය ය. (4) වඩිග බමුණා, රාජමුළු යකා, කුඩය ය.

- **ප්‍රශ්න අංක 35 - 40 තෙක් නිවැරදි පිළිතුර තෝරන්න.**

35. සංගීතය නාට්‍යයකට අත්‍යවශ්‍ය ම නොවන කලාවක් බව ප්‍රකාශ කළ නාට්‍ය වන්නේ,
(1) සුබ සහ යස ය. (2) කැලණි පාලම ය. (3) දුන්න දුනු ගමුවේ ය. (4) නරිබෑණා ය.

36. සෙක්කුව නාට්‍යයේ නිර්මාණකරුවා වන්නේ,
(1) ආර්. ආර්. සමරකෝන් (2) සයිමන් නවගත්තේගම
(3) එදිරිවීර සරච්චන්ද්‍ර (4) පරාක්‍රම නිරිඇල්ල

37. සමාරෝපය යන්නට වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) මුහුණේ අංගෝපාංගයන් මඟින් අදහස් ප්‍රකාශනය යි.
(2) චරිතයට අදාළ වචන කතා කිරීමයි.
(3) පරිකල්පනයෙන් මවා ගන්නා චරිත නිරූපණය කිරීමයි.
(4) තමා වෙනුවට වෙන අයෙකු නිරූපණය කිරීමයි.

38. ප්‍රකාශනාත්මක චලන නිරූපණය හා සම්බන්ධ වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ කුමක් ද?
(1) සතර අභිනය මඟින් අදහස් ප්‍රකාශනය කරයි.
(2) රිද්මය හා නාදයේ සුවිශේෂතා හඳුනාගනියි.
(3) නාට්‍යයක් රඟදැක්වීමේ පුහුණුව ලබයි.
(4) ශාරීරික මානසික චලන හුරුවෙයි.

39. සිංහල ගැමි නාටකය කෘතිය රචනා කරන ලද්දේ,
(1) සයිමන් නවගත්තේගම විසිනි (2) එදිරිවීර සරච්චන්ද්‍ර විසිනි
(3) මුදියන්සේ දිසානායක විසිනි (4) එම්. එච්. ගුණතිලක විසිනි

40. ශ්‍රී ලංකාවේ ඉතිහාසයේ කතා පුවතක නව අර්ථකථනයක් ලෙස නිර්මාණ වූ නාට්‍යය වන්නේ,
(1) මනමේ ය. (2) සිංහබාහු ය. (3) නරිබෑණා ය. (4) කුවේණි ය.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

10 ශ්‍රේණිය

නාට්‍ය හා රංගකලාව - II

නම/ විභාග අංකය:

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

01. දික්තල කාලගෝල නාට්‍ය පෙළ ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර සපයන්න.

(i) දික්තල කාලගෝල නාට්‍යයේ මුල් නිර්මාණකරුවා නම් කරන්න. (ලකුණු 02)

(ii) ඔහුගේ වෙනත් නිර්මාණ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iii) දික්තල කාලගෝල නාට්‍යය මුල් නිර්මාණයට වඩා වෙනස් කර ඇති අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු 02)

(iv) දික්තල කාලගෝල නාට්‍යයේ නාට්‍යෝචිත අවස්ථා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(v) මෙම නාට්‍යයේ අවසානයේ කාලගෝලයා ගයන ගීතයේ අරුත කෙටියෙන් ලියන්න. (ලකුණු 02)

(vi) මෙම නාට්‍යයේ ප්‍රබලතා හා දුබලතා එක බැගින් ලියන්න. (ලකුණු 02)

02. (i) 60-70 දශකයේ වේදිකා රංගන ශිල්පියෙක් හා ශිල්පිනියක් බැගින් නම් කරන්න. (ලකුණු 02)

(ii) ඔවුන් රඟ දැක් වූ නාට්‍ය දෙක බැගින් වෙන් වෙන්ව ලියන්න. (ලකුණු 04)

(iii) ඉහත සඳහන් කළ එක් අයෙක්ගෙන් නාට්‍ය කලාවට සිදු වූ මෙහෙය විස්තර කරන්න.(ලකුණු 06)

03. (i) රංග භූමිය යනු නිර්වචනය කරන්න. (ලකුණු 02)

(ii) රංග භූමියේ ආරම්භය හා විකාශය පැහැදිලි කරන්න. (ලකුණ 04)

(iii) ඔබ දන්නා රංග භූමියක් ඇඳ එහි කොටස් නම් කරමින්, ඒවා නාට්‍යයට භාවිත කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

04. (i) අංග රචනය යනු නිර්වචනය කරන්න. (ලකුණු 02)

(ii) අංග රචනය ප්‍රභේද කීය ද? නම් කර විස්තර කරන්න. (ලකුණු 04)

(iii) අංග රචනා ශිල්පියා අවධානය යොමු කළ යුතු කරුණු විස්තර කරන්න. (ලකුණු 06)

05. (i) ගර්භාරක්ෂක ශාන්තිකර්මයක් නම් කරන්න. (ලකුණු 06)

(ii) ඒවා පැවැත්වීමේ මූලික අරමුණු හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) එම ශාන්තිකර්මයේ නාට්‍යමය පෙළපාලි විස්තර කරන්න. (ලකුණු 06)

06. (i) රංග ක්‍රීඩා යනු නිර්වචනය කරන්න. (ලකුණු 02)

(ii) රංග ක්‍රීඩා දෙකක් නම්කර ඒවා සිදු කළ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) රංග ක්‍රීඩාවලින් නළුවන්ට ලැබෙන ප්‍රයෝජන හා නළු කාර්යේ දී ඒවා භාවිතා වන ආකාරය උදාහරණ දෙමින් විස්තර කරන්න. (ලකුණු 06)

07. පහත දැක්වෙන කථා සාරාංශය පදනම් කරගෙන ඒකාංක නාට්‍යයක් රචනා කරන්න. පැය කිහිපයක් තුළ සිදුවන සිද්ධීන් එක් ස්ථානයකට සීමා වන සේ නාට්‍ය වස්තුව සකස් කළ යුතු ය.

ඇමතුම දෙපාරක්, තුන්පාරක් දුරකථනයේ නාද වූව ද ගණනකට ගැනීමට තරම් විවේක සිතිවිල්ලක් විනීතගේ සිතෙහි නොමැති විය. වරක් දෙවරක් නොව එක දිගට නාද වන දුරකථනය ඔහුට ඉමහත් කරදරයක් ගෙන දුන්නකි. තම මව සමඟ අයියා, අක්කා විනෝද ගමන ගියේ තාත්තාගේ විරෝධතාව නොසලකාය. ඒ මතක් වූ විගස විනීත පුටුවෙන් නැගිට්ට විදිය ඔහුට මතක නැත. දිගටම නාදවන දුරක්ථනය නතරවිය. විනීත දුරකථනය අතට ගත්තේ නැවතත් ඒ අංකයට ඇමතීමට අදිටන් කර ගනිමිනි. එවිටම නිවස ඉදිරිපිට කිසිවෙකු තමාගේ නම කියා අමතන හඬ ඇසෙත් ම විනීත ඉක්මනින් ගොස් නිවස ඉදිරිපිට බලන විට .....

(i) පසුබිම් කාලය, සිදුවීම් හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන, සංවාද, යොදා රචනා කිරීම සඳහා (ලකුණු 04)

(ii) චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් අවස්ථාව ගොඩ නැංවීම සඳහා (ලකුණු 04)

(iii) කුතුහලය දනවන නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ලකුණු 04)

පිළිතුරු පත්‍රය - I කොටස

1 -(4)	2 -(2)	3 -(1)	4 -(4)	5 -(1)	6 -(1)	7 -(4)	8 -(1)	9 -(3)	10 -(4)
11-(2)	12 -(4)	13 -(2)	14 -(3)	15 -(3)	16 -(3)	17 -(2)	18 -(4)	19 -(3)	20 -(1)
21-(3)	22 -(4)	23 -(1)	24 -(2)	25 -(4)	26 -(2)	27 -(3)	28 -(3)	29 -(1)	30 -(4)
31-(3)	32 -(3)	33 -(4)	34 -(3)	35 -(2)	36 -(4)	37 -(4)	38 -(2)	39 -(2)	40 -(4)

II කොටස

(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින්)

01. (i) චාල්ස් සිල්වා ගුණසිංහ ගුරුන්නාන්සේ

(ii) කාලිංග, සිරිමල් එතනා, වෙස්සන්තර, සඳකිඳුරු, ආදී නිවැරදි පිළිතුරට ලකුණු ලබා දෙන්න.

(iii) මහෞෂධ පඬිවරයා විසින් ප්‍රශ්නය විසඳීම, කාලගෝල දික්පිටියාට දික්තලා බාර දීම.

(iv) ගඟ තරණය අවස්ථාව, මහෞෂධ පඬිවරයා නඩුව විසඳන අවස්ථාව

(v) ගීතය හෝ ගීතයේ අදහස ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(vi) ප්‍රබලතා - සරල කතන්දරයක් නට්‍යෝචිත ලෙස ඉදිරිපත් කර තිබීම.

දුබලතා - සේවය සඳහා මිල ගෙවනු ලබන්නේ දියණිය පාවා දීමෙනි.

02. (i) නිරූපණ ශිල්පීන් - විජේරත්න වරකාගොඩ, විජය නන්දසිරි, ගාමිණි සමරකෝන්

නිරූපණ ශිල්පිනියන් - මානෙල් ජයසේන, අනුලා බුලත්සිංහල, ආදී නිවැරදි පිළිතුරට ලකුණු ලබා දෙන්න.

(ii) වෙන් වෙන්ව නාට්‍ය ලියා තිබිය යුතුය.

(iii) අදාළ කාලය හා රඟ පෑ නාට්‍ය හතරක්වත් නම් කිරීමට. (ලකුණු 02)

ආදළ ක්ෂේත්‍ර (රංගනය, අධ්‍යක්ෂණය, වේදිකාව, රූපවාහිනිය, ටෙලිනාට්‍ය නම් කිරීම හා විස්තර කිරීමට (ලකුණු 02)

නාට්‍ය කලාවට සිදු කළ විශේෂ සේවාවක් උදාරණ ඇසුරෙන් විස්තර කිරීමට. (ලකුණු 02)

03. (i) නාට්‍යක් රඟ දක්වන ඕනෑම ස්ථානයක් රංග භූමියකි. (පිළිතුරට ලකුණු ලබා දෙන්න. ලකුණු 02)

(ii) වැදි යුගයේ ජනතාවගේ ක්‍රියාකාරකම් හා සම්බන්ධ ගිනිමැල භූමියෙන් ඇරඹී රංග භූමිය පින්තූර රාමු වේදිකාව දක්වා විකාශය වීමට (ලකුණු 04 ක් දෙන්න.)

(iii) රංග භූමියක් ඇඳ කොටස් නම් කරමින් එය නාට්‍යයකට භාවිත කරන ආකාරය පැහැදිලි කිරීමට (ලකුණු 06)

04. (i) මුහුණු ප්‍රධාන කොටගත් ප්‍රේක්ෂකයාට නිරාවරණය වූ ශරීරයේ කොටස් චරිතයකට ගැලපෙන පරිදි වර්ණ ගැන්වීම යි. ආදී නිවැරදි පිළිතුරට ලකුණු ලබා දෙන්න. (ලකුණු 02)

(ii) දෙකකි. සරල අංග රචනය / චරිතාංග අංග රචනය, ඒවා විස්තර කර තිබීම. (ලකුණු 04)

(iii) නාට්‍ය ශෛලිය / චරිතයේ සවභාවය / නළුවාගේ සමෙහි වර්ණය / අනෙකුත් ආනුෂංගික කලාවල භාවිත වර්ණයන් / වර්ණ හා රේඛා පිළිබඳ අවබෝධය

භාවිත ද්‍රව්‍යවල ගුණාත්මක තත්වය ආදී ලක්ෂණ හතරක්වත් විස්තර කර තිබීම. (ලකුණු 04)

නාට්‍ය නම් කරමින් උදාහරණ පැහැදිලි කර දෙමින් සිදු කර ඇති සමස්තයට (ලකුණු 02)

Past Papers Wiki

05. (i) රටයකුම හෙවත් රිද්දි යාගය නිවැරදි පිළිතුරට ලකුණු ලබා දෙන්න. (ලකුණු 02)

(ii) වඳ ස්ත්‍රීන්ට දරුවන් පැතීම. / පිළිසිඳගත් ගැබ ආරක්ෂා කිරීම. / දරුවා කිසිඳු උපද්‍රවයකින් තොරව ප්‍රසූත කිරීමට හැකි වීම. / අළුත උපන් දරුවා ලෙඩ රෝගවලින් ආරක්ෂා කර ගැනීම.
(ලකුණු 04)

(iii) නානු මුරය / කපු යක්කාරිය / දරු නැලවිල්ල වන නාට්‍යමය පෙළපාලි නම් කිරීමට (ලකුණු 01)
හා නාට්‍යමය ලක්ෂණ භාවිත වන ආකාරයට පැහැදිලි කර තිබීම සඳහා (ලකුණු 02)
නාට්‍යමය පෙළපාලි දෙකක්වත් ඒ ආකාරයෙන් විස්තර කර තිබීම සඳහා (ල. 3 × 2 = 06)

06. (i) ආධුනික නළුවාට අවශ්‍ය රංගන කුසලතා ඇති කර ගැනීම සඳහා සිදු කරනු ලබන ක්‍රීඩා රංග ක්‍රීඩා නම් වේ... ආදී නිවැරදි පිළිතුරට ලකුණු ලබා දෙන්න. (ලකුණු 02)

(ii) බල්ලා සහ මස්කටුව / මෝරා හා දූපත් / අංක ක්‍රීඩාව / නායකයා සෙවීම ආදිය නම් කරමින් සිදු කළ ආකාරය විස්තර කර තිබීමට (ලකුණු 04)

(iii) සාමූහිකව කටයුතු කිරීමට හැකිවීම. / නායකත්වයට ගරු කිරීම. / කණ්ඩායම් හැඟීම ඇති වීම./ ක්ෂණික ක්‍රියාත්මක වීම.
සිරුරේ න්‍යාමශීලීත්වය ඇති වීම ආදී ප්‍රයෝජන තුනක් වත් විස්තර කර තිබිය යුතුයි. (ලකුණු 06)

07. (i) පසුබිම් කාලය, සිදුවීම් හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන, සංවාද යොදා රචනා කිරීම සඳහා (ලකුණු 04)

(ii) චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් අවස්ථාව ගොඩ නැංවීම සඳහා (ලකුණු 04)

(iii) කුතුහලය දනවන නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා.
(ලකුණු 04)

PAST PAPERS WIKI

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

10 ශ්‍රේණිය

නාට්‍ය හා රංගකලාව

ප්‍රායෝගික පරීක්ෂණය

01. දික්තල කාලගෝල නාට්‍යයේ ඔබ කැමති සංවාදයක් රංගනය සහිතව ඉදිරිපත් කරන්න. (ලකුණු 15)
02. ඔබ කැමති නාට්‍ය ගීතයක් රංගනය සමඟ ඉදිරිපත් කරන්න. (ලකුණු 15)
03. ඔබ කැමති සුරංගනා කතාවක් / ජනකතාවක් / විදේශීය කතාවත් ඇසුරෙන් කතන්දරයක් රංගනය සමඟ ඉදිරිපත් කරන්න. (ලකුණු 15)
04. පහත ක්ෂණික නිරූපණ මාතෘකා ඇසුරෙන් නාට්‍යෝචිත අවස්ථාක් ඉදිරිපත් කරන්න. (ලකුණු 15)
    (i) අඹ ගසක මුදුනේ සිටින විට විදුහල්පතිතුමා ඇවිත්
    (ii) යාළුවෙක් සමඟ විහිළුවට රණ්ඩු කරද්දී ඔහුගේ දතක් කැඩීම.
    (iii) නිවස ඇතුළත දුමක් පෙනීම.
    (iv) මහ රාත්‍රියේ නිවස තුළ සිටිය දී වහලය පැත්තෙන් සීනු හඬක් ඇසීම.
    (v) හදිසියේ පෙම්වතිය / පෙම්වතා හමුවට යන විට දත් කැක්කුමක් සැදී
    (vi) පාසල ඉදිරිපිට සිටගෙන සිටින විට තම හතුරාගේ මව දකිද්දී
    (vii) පාසල් බෑගය විවෘත කරන විට ම එහිතුළ වූ සර්පයා දැක
    (viii) දුරකථන ඇමතුමක් වැරදී.
05. ඔබ කලින් නිර්මාණය කරන ලද නාට්‍යයක් ඉදිරිපත් කරන්න. (කණ්ඩායම් ක්‍රියාකාරකම) (ලකුණු 20)
06. ඔබ පන්ති කාමරයේ සිදු කරන ලද ප්‍රකාශනාත්මත චලන ඇසුරෙන් නිර්මාණය කළ රංග වින්‍යාසයක් ඉදිරිපත් කරන්න. (කණ්ඩායම් ක්‍රියාකාරකම්) (ලකුණු 20)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank